**සීමාසහිත ගල් ඔය වැව්ලි පුද්ගලික සමාගම - 2017/2018**

---

සීමාසහිත ගල් ඔය වැව්ලි පුද්ගලික සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සමාගම පිහිටුවීම හා සමාගමේ අයිතිය

සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2008 සැප්තැම්බර් 19 දින සංස්ථාගත කරන ලද සීමිත සමාගමක් වන අතර හිමිකාරීත්වයෙන් සියයට 51 ක් රජය සතු වේ.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2006/2007 වර්ෂයේ සිට සමාගම අලාභ ලබමින් පවත්වා ගෙන ගොස් තිබූ අතර එම වර්ෂයේදී රු. මිලියන 219 ක් වූ අලාභය වසර 10 කට පසු සමාලෝචිත වර්ෂය වන විට රු. මිලියන 1,352 ක් දක්වා සියයට 517 කින් පමණ සීඝ්‍ර ලෙස වැඩිවී තිබුණි. තවද 2016/2017 මූල්‍ය වර්ෂය අවසානය වන විට සමාගමේ මුළු වත්කම් අභිබවා ගිය ණය ප්‍රමාණය රු.3,064,962,691 ක් වූ අතර එය 2017/2018 මූල්‍ය වර්ෂය අවසානයට රු.4,417,401,944 ක් දක්වා එනම් සියයට 44 කින් පමණ වැඩි වී තිබුණි. සමාගම විසින් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය අරමුදල් තම සම්බන්ධිත පාර්ශවයන්ගෙන් සහ මූල්‍ය ආයතන වලින් සියයට 15 සිට සියයට 28 දක්වා වූ ඉහල පොලී අනුපාතිකයන් යටතේ ලබාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ලබා ගෙන තිබූ මුළු ණය හා කල්බදු වටිනාකම රු.6,759,118,270 ක් විය. කෙසේ වුවද මෙම ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ණය පොලී වියදම රු.1,193,519,762 ක් වී තිබූ අතර එම ණය පියවීමට තරම් ප්‍රමාණවත් ආදායමක් කර්මාන්තශාලාව තුලින් ජනනය කර ගැනීමට සමාගම අපොහොසත් වී තිබූ අතර ඒ අනුව සමාගම පත්ව ඇති මෙම මූල්‍ය අර්බුදකාරීත්වය හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 19 (ඇ) ඡේදය ප්‍රකාරව, පරිපාලන හා වෙනත් පොදු කාර්ය පිරිවැය දේපළ පිරියත උපකරණ හා ගොඩනැගිලි පිරිවැයට ඇතුළත් කළ නොහැකි වුවද, රු.95,977,641 ක් වූ පරිපාලන හා පොදුකාර්ය පිරිවැය දේපල පිරියත උපකරණ හා ගොඩනැගිලි වටිනාකම තුළ ප්‍රාග්ධනිත කර තිබූ බැවින් සමාගමේ ස්කාගාරය සහ ගොඩනැගිල්ලේ වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද රු.78,883,433 ක් වටිනා දේපළ පිරියත හා උපකරණ තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඒවායේ ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කිරීමට හෝ ප්‍රත්‍යාගණනය කර නැවත ගිණුම් වලට ඇතුළත් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

# 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති වැදගත් සීමා කිරීම් වලට යටත්ව, විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් ප්‍රමාණවත් ලෙස ලැබුණු බවත් මාගේ පරීක්ෂණවලින් පෙනී යන අන්දමට සමාගම විසින් ප්‍රමාණවත් පොත්පත් හා වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

(ඇ) සමාගම් පනතේ 220 වගන්තියේ නියම කර ඇති විධිවිධානයන්ට අනුව සමාගම කටයුතු කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

වර්ෂයකට අධික කාලයක සිට උක් පර්යේෂණ ආයතනයට ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.4,014,912 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසානවන විටත් නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

**2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය හා ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව සීනි නිෂ්පාදන කර්මාන්තශාලාව සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු වුවද සමාගම විසින් එසේ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,352,439,253 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 956,794,464 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 395,644,789 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය පිරිවැය රු. 446,103,282 කින් හෙවත් සියයට 60 කින් වැඩි වීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

( අ) සමාගමෙහි ජංගම වත්කම් අනුපාතය 2016/2017 වර්ෂයේදී 0.29 : 1 ක් වුවද, 2017/2018 වර්ෂය වන විට එය 0.26 : 1 දක්වා අඩුවී තිබුණි.

(ආ) සමාගමෙහි ශුද්ධ අලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 95 සිට සියයට 109 දක්වා වැඩි වී තිබුණි.

(ඇ) සමාගමෙහි තෝලන අනුපාතය 2016/2017 වර්ෂයට සාපේක්ෂව 1.97 සිට 2.22 දක්වා වැඩි වී තිබුණු අතර, මුළු වගකීම් හිලව් කිරීමට ප්‍රමාණවත් මුළු වත්කම් ප්‍රමාණයක් ආයතනය සතුව නොපවතින බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ කළමනාකරණ කටයුතු සිදු කිරීම සඳහා කළමනාකරණ ගිවිසුමක් මගින් සමාගමේ සියයට 49 ක හිමිකාරීත්වය ඇති ලංකා ඔරික්ස් ලීසිං සමාගම සහ බ්‍රවුන්ස් සහ සමාගම යටතේ පවතින ගල්ඔය හෝල්ඩිංග්ස් සමාගම වෙත 2010 අප්‍රේල් 26 දින පවරා තිබුණි . සමාගමේ දිගින් දිගටම පැවති මූල්‍ය අර්බුදකාරී තත්ත්වයන් මඟ හරවා ගැනීමට සහ කාර්ය සාධනය ඉහළ නැංවීමට කටයුතු කිරීමට ගත වූ වසර 8 ක කාලපරිච්ඡේදය තුළදී අවශ්‍ය මඟපෙන්වීම හා උපදෙස් එම සමාගම විසින් ලබා දී නොතිබුණි.

(ආ) උක් වගා බිම් සකස් කිරීම සඳහා ගොවීන් වෙත ලබා දුන් වසර 3 කට වඩා පැරණි ණය ශේෂ එකතුව වූ රු. 19,986,574 ක් සමාලෝචිත වර්ෂය වන විටත් අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඇ) ගොවීන් වෙත කෘෂිකාර්මික කටයුතු සඳහා ලබා දී ඇති වසර 2 කට වඩා පැරණි ණය ශේෂයන්හි එකතුව වූ රු.58,883,052 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කර්මාන්තශාලාවේ වාර්ෂික ඇඹරීම් කළ හැකි උපරිම උක් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 400,000 (දිනකට 2000 × මෙහෙයුම් දින 200) ක් වුවද, 2017/2018 වර්ෂවල දී ඇඹරා තිබූ උක් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 169,940 ක් වීමෙන් භාවිතයට නොගත් ධාරිතාවය සියයට 58 ක් විය. කෙසේ වුවද 2013/2014 වර්ෂයේ සිට වසර 05 ක දත්ත සංසන්දනය කර බැලීමේදී 2014/2015 වර්ෂය වන විට වාර්ෂික උක් සැපයුම මෙට්‍රික් ටොන් 259,289 ක් වී තිබුණද, 2017/2018 වර්ෂය වන විට එය මෙට්‍රික් ටොන් 182,582 ක් දක්වා අඩු වී තිබුණි.සමාගම ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කර්මාන්තශාලාවේ උපරිම ධාරිතාවය වන උක් මෙට්‍රික්ටොන් 400,000 ක් ඇඹරීමට ප්‍රමාණවත් උක් සැපයුමක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඒ හේතුවෙන් කර්මාන්තශාලාව උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි.

(ආ) සමාගමේ වසර 5 ක දත්ත සන්සන්දනය කර බැලීමේ දී සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය 2014/2015 වර්ෂයේ සියයට 8.1 ක් වුවද, සමාලෝචිත වර්ෂය වන විට සියයට 7.5 දක්වා අඩු වී තිබූ අතර සමාගමේ උක් ගසක පවතින සීනි ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වී තිබුණි. 2012/2013 වර්ෂයේ දී සියයට 10.9ක් වූ එය සමාලෝචිත වර්ෂය වන විට සියයට 9.1 දක්වා අඩු වී තිබූ නමුත් එම ප්‍රතිශතය වැඩි කරගැනීමට කළමණාකරනය කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012/2013 වර්ෂයේ සිට 2016/2017 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ක කාලය තුළ හෙක්ටයාරයකට ලබා ගත හැකි උක් ඵලදාව ක්‍රමයෙන් පහළ ගොස් තිබුණු බව නිරීක්ෂණය විය.2014/2015 වර්ෂයේදී උක් ඵලදාව හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 74 ක් වුවද, 2017/2018 වර්ෂය වන විට එය මෙට්‍රික් ටොන් 65 ක් දක්වා අඩු වී තිබුණද, මෙම තත්ත්වය වර්ධනය කර ගැනීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

## 4.3 කාර්යමණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ ස්ථිර සේවකයින් 182 දෙනෙකු හා කොන්ත්‍රාත් සේවකයින් 649 දෙනෙකු ඇතුලුව මුළු සේවකයින් 831 දෙනෙකු විය. මෙම කාර්ය මණ්ඩලය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන නොතිබූ අතර විධිමත් බඳවා ගැනීමේ හා උසස් කිරීම් පටිපාටියක්ද අනුමත කරගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී  නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාරක ප්‍රාග්ධන කළමණාකරණය | කෙටි කාලීන ණය ගැනීම් වැඩි වීම හා ඒ මත අධික පොළී ගෙවීම් සම්බන්ධයෙන් අවධානය යොමු නොකිරීම. |
| (ආ) | ණය ගැති පාලනය | ගොවීන් වෙත ලබා දී ඇති පැරණි ණය  ශේෂ අයකර නොගැනීම. |
| (ඇ) | මෙහෙයුම් පාලනය | (i) සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය, උක් ගසෙහි පවතින  සීනි ප්‍රමාණය වැඩි කරගැනීම කෙරෙහි අවධානය යොමු නොකිරීම.<br>(ii) කර්මාන්තශාලාව උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම. |
| (ඈ) | ප්‍රසම්පාදනයන් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය නොකිරීම,පිරිවැය ඇස්තමේන්තු, තාක්ෂණික පිරිවිතර,සේවා ගිවිසුම් ඇති කර නොගැනීම. |